විචාරය

අධිනීතිඥ ලක්ෂ්මන් වැලිවිටිය.



# සාමයේ විසංවාදය

''සාමය'' ලංකාවට අවශ්‍ය අපූර්වතම වචනය වෙයි. ඊට සමපාතව බලය බෙදීම, ඒකීය, ෆෙඩරල් යනාදිය සංග්‍රාමිකව සංසරණය කරයි. බොහෝදෙනෙක් ලංකාවේ ජනවාර්ගික අර්බුදයක් ඇති බව පවසති. අනෙක් පාර්ශවය ඇත්තේ ත්‍රස්තවාදී ප්‍රශ්නයකැයි කියති. මේ මත ජාතිද්‍රෝහීන්ද, ජාතිවාදීන්ද, දෙපස බෙදී මතවාදී තලයේ මෙන්ම, අවයව උපයෝගී කර ගනිමින්ද, පාරම්බාමින් සිටිති.

ඉන්දියාව ජේ.ආර්. ගේ බෙල්ලෙන් අල්ලා පළාත් සභා ඇති කළේය. යූ.එන්.පී. යට පළාත් සභා ඇති කිරීමට අවශ්‍ය නොවීය.එම ගිවිසුමේ ම අනු සාංගික පියවරක් ලෙස රජීව් ගාන්ධි මැරුම් කෑවේය. එම ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව සිරිමාවෝ බණ්ඩාරනායක හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කඳුළු ගෑස් කමින් බැටන් ප්‍රහාර හා රබර් බුලට් ඉවසමින්, කොටුවේ බෝධිය ළඟ විරෝධතා දැක්වීය. ශ්‍රී.ල.නි.පයේ ලේකම් සුරියප්පෙරුම කීවේ පළාත් සභා සංශෝධනයට අත් උස්සන අයගේ අත් කපා අධෝමාර්ගය සේදීම සඳහා ප්‍රසිද්ධ වැසිකිළිවල එල්ලා තැබිය යුතු බවය. එසමයේ විජයකුමාරතුංග, චන්ද්‍රිකා හා වාමාංශිකයින් සිටියේ ජේ.ආර්. සමඟය.
චන්ද්‍රිකා බලයට පත්වීමත් සමඟම ශ්‍රී.ල.නි.ප.ය. ෆෙඩරල් වූවා නොව කළා ය. රනිල් වික්‍රමසිංහ හොර රහසේ එල්.ටී.ටී.ඊ. ය සමඟ ගිවිසුම් ඇති කර ගනිමින් බලය අහිමි කර ගත්තා පමණක් නොව, නැවත බලයට ඒමට තිබු අවස්ථාවද නැති කර ගත්තේ ය. පළාත් සභා සඳහා ජේ.ආර්. සමඟ එකඟ වූ වාමාංශිකයින් ෆෙඩරල් කරුවකු වූ රනිල් ප්‍රතික්ෂේප කොට ඒකීය සංකල්පය කිවු මහින්ද සමඟ එකතු වීය. චන්ද්‍රිකාගේ පැකේජය හරහා ද, සුනාමි සහන මණ්ඩලය ගැනද, රටේ ප්‍රබල ඇමතිවරයකු වූ මහින්ද රාජපක්ෂ විරෝධතාවයක් නොදැක්වීය. තමන්ගේ වාරය පැමිණි විට ඔහු ඒකීය විය. බලයට පැමිණි පසු නිශ්චිතවම ඒකීයද, ෆෙඩරල් ද කිව නොහැකි වී ඇත. විසංවාදය පැන නගින්නේ මෙතැනින්ය. නීති විශාරදයකු මෑතකදී මට පැවසුවේ සාමය සඳහා වූ විසංවාදයට මූලික කරුණු දෙකක් බල පෑ බවය.

1. සාමයේ ව්‍යාපාරය. වාමාංශිකයන් අතට පත්වීම.
2. සාමයේ ව්‍යාපාරය එන්.ජී.ඕ. කරුවන් අතට පත්වීම.

වාමාංශිකයන් බලය බෙදීම, ස්වයං පාලනය, ෆෙඩරල් ක්‍රමය, පංති සහෝදරත්වය කථා කළේය. නමුත් බලය ලැබූ පළමු අවස්ථාවේදීම ''ඒකීය'' යන වචනය කිසිඳු හිරිකිතයකින් තොරව ව්‍යවස්ථාවට ඇතුළු කළ අතර, අදත් එම මතවාදයෙන් ගොඩඒමට නොහැකි වී ඇත. කියන්නේ එකකි. කරන්නේ තව එකකි. ජාත්‍යන්තර වාදය ගැන හිතනවා චීනා උතුරු කොරියාව, කියුබාව, චීනය පමණක් නොව නිකරගුවාව, බ්‍රසීලය පවා පදනම් වී ඇත්තේ ජාතිකත්වය මතබව මොවුන් අමතක කරති. ජාතිකත්වයක් නොමැති මොවුන්ගේ අදහස් ජනතාව විශ්වාස නොකරති.

අනෙක් අතට සාම ව්‍යාපාරය, එන්.ජී.ඕ.කාරයන් අතට පත්වීමත්, එම රාජ්‍ය නොවන ආයතන ක්‍රියාත්මක කරන්නන්, ඩොලර් කාක්කන් ලෙස එනම් විදේශීය ව්‍යාපෘතියක කොටස්කරුවන් ලෙසින් ජනතාව තුළට කා වැදීමත්, සාමයට මහත් බාධාවකි. ''වාමාංශික දේශපාලනය මෙරට පමණක් නොව ලෝක පරිමාණයෙන්ද, අඩාලව දුර්වල වී තිබුණත් බොහෝ වාමාංශික ක්‍රියාදරයන්, තම පැවැත්ම සඳහා යොමු වුයේ එන්.ජී.ඕ. වලටය. ස්වාධීන යයි කියමින් මුදල් සොයන්නට වූ විශ්වවිද්‍යාලයීය ඇඳුරන්ටද එන්.ජී.ඕ. හොඳ තෝතැන්නක් වීය. (මව්බිම - මාර්තු 4)

රාජිත සේනාරත්න, ඩිලාන් පෙරේරා, මර්වින් සිල්වා යන සාම ක්‍රියාදරයන් විහාර මහා දේවි උද්‍යානයේදී සාම රැළියට කඩා වැදුණු භික්ෂූන් සමඟ සාම යුද්ධයක නිරත වූහ. ඩිලාන් පෙරේරා පැවසුවේ මේ සාම රැළියට කඩා වැදුනේ ජේ.වී.පී. කාරයන් බවත්, ඔවුන් එල්.ටී.ටී.ඊ. කාරයන් මෙන්ම මැර පිරිසක් බවත් ය. නමුත් මෙම මර්වින් සිල්වාම නුගේගොඩ සාම රැළිය කඩාකප්පල් කළේය. පහර දී පොඩිකර දමන ලදී. තම සහෝදර මන්ත්‍රීවරයා ගේ මේ ක්‍රියාකලාපය ගැන ඩිලාන් කෙඳිරියක්වත් නැගුවේ නැත. සාමයේ විසම්මුතිය නැගෙන්නේ මෙතැනින්ය.

චන්ද්‍රිකාගේ පැකේජය හා සුනාමි සහන මණ්ඩල හරහා ඩිලාන් යුද්ධයට එරෙහි යෝධයෙක් වීය. එසේම මහින්දගේ ජාතිවාදී වැඩපිළිවෙලටත්, ඒකීය සංකල්පයටත්, ඔහු එරෙහි වීය. පෙබ-රවාරි මස 18 වැනිදා, මව්බිම පුවත්පත මෙසේ කියයි.
''නිදර්ශනයක් ලෙස ඩිලාන් පෙරේරා ඇමැතිවරයා ගනිමු. ඔහු පසුගිය කාලය පුරාම, වාම සාම වේදිකාවල නැගී ජාතිවාදයට එරෙහිව හඬ නැගීය. බොහෝදෙනා සිතුවේ ඩිලාන සාමය වෙනුවෙන් පෙනී සිටිනවා කියා ය. එහෙත් රට තුළ විශාල භීෂණ නිර්මාණය වෙමින් තිබුණේය. උතුරු නැගෙනහිර පමණක් නොව දකුණෙත්, කොළඹ දීත්, තරුණයන් අත්අඩංගුවට ගැනීම්, පැහැර ගැනීම් හා ඝාතන එන්න එන්නම වැඩි වීය. ඒත් දැන් බොහෝදෙනා නිහඬය. ඩිලාන් ගේ හඬ ඒකාකාරීය. ඒත් රිද්මය වෙනස් ය. එදා යුද්ධය විවේචනය කළ ඔහු අෑ, යුධ ආණ්ඩුව ආරක්‍ෂා කිරීම වෙනුවෙන් පෙනී සිටීමට කොන්දේසි විරහිතව පැමිණ ඇත.'' එසේම ඔහු පසුගිය දිනක ''සන්ඩේ ඔබ්සර්වර්'' පුවත්පතට කියා සිටියේ ''ගෝඨාභය රාජපක්ෂ'' ආරක්ෂක ලේකම්ට සුදුසුම පුද්ගලයා බවය. ඒ ඔහු යුද්ධය, කරන නිසාය.

වාසුදේව නානායක්කාර සාම වේදිකා-වේ යෝධයෙක් ය. 2007 පෙබරවාරි 11 වන දින ''රාවයට'' ඔහු මෙසේ කියයි.
''මෙහි පරස්පරයක් තිබෙන බව ඇත්ත. පරස්පරයක් තිබ්බත් ඒවා එකි-නෙකට සම්බන්ධ තවත් විදියකින් ප්‍රයෝජනවත් වෙන්න පුළුවන්. එල්.ටී.ටී.යට තමන්ගේ ප්‍රදේශ අත්පත් කර ගෙන ඉන්න බැරිවීමත් එක්ක ඔවුන්ට තමන්ගේ තත්ත්වය හා ශක්තිය ගැන නිසි තක්සේරුවකට එනවානේ. ඒකත් ප්‍රයෝජනවත් වෙන්න පුළුවන් විසඳුමකට.'' ඔහු මහින්දගේ යුද්ධය සාධාරණීය කරණය කළේ එසේය. ඔහුට මේ නුවණ පහළවීමට මෙතරම් කළක් ගතවූයේ මන්ද?

මහින්දගේ ජාතිවාදී වැඩපිළිවෙල මාධ්‍ය හරහා පතුරු ගැසූ ''රාජිත සේනාරත්න'' සාමයේ ගෝඨයිම්බරයෙක් බඳු විය. ඔහු මෑතක කැබිනට් රැස්වීමකට මෙසේ පැවසුවේය. ''... .එදා මෙම කාලතුවක්කු සම්බන්ධ ගනුදෙණුව වුනා නම්, අපට ලැබිය යුතුව තිබුණේ පරණ කාලතුවක්කු කිහිපයක්. ඒත් මෙවර අපට එම මුදලටම ලෝකයේ හොඳම අවි සමාගමකින් මේ අවි මිලදී ගැනීමට ලැබී තිබෙනවා. ...'' (12.02.07 - මව්බිම) යුද්ධය ගැන විරුද්ධ රාජිත මේ අලුත් සිංදුව ගයන්නේ කාලතුවක්කු වලින් කොස් කොටන්නට වත් සිතා ගෙනදැයි නොදනියි.

නීතිඥ ශිරාල් ලක්තිලක කොන්දේසි විරහිතව සාමය වෙනුවෙන් පෙනී සිටියේය. ඔහු රාවයට මෙසේ කියයි. ''පනහ - හැත්තෑව දශකවල පැවති සිංහල මානසිකත්වය, ඊටත් වඩා ජාතිවාදී ඉසව්වකට හරවන්න යුධ උද්මාදය හරහා ප්‍රභාකරන් වැඩිදායකත්වයකට නැංවීය. ඔහුගේ පුද්ගල ඝාතන වැඩපිළිවෙල නතර කළහොත් නිසැකවම සිංහල සමාජයේ ප්‍රතිචාරය මීට වඩා බොහෝ සෙයින් වෙනස් විය හැක...'' (2007.02.18) ඔහු දෙපස තබා සිටි පදනම ලිහිල් වන බවක් පෙනෙයි.

රාවය පුවත්පත ද, ජනාධිපති මැතිවරණ සමයේදී කොන්දේසි විරහිතව උපරිම බලය බෙදීම වෙනුවෙන්ද, යුද්ධයට එරෙහිවද පෙනී සිටියේය. යුද්ධයක් නොවු එකළ සුමනසිරි ලියනගේ, ජයදේව උයන්ගොඩ ආදී ෆෙඩරල්වාදීන් ගේ ලිපි වලින් රාවය පිරී තිබුණේය. දැන් ඇත්ත වශයෙන්ම රට තුළ යුද්ධයක් ඇත. ඒත් මෙම ලේඛකයින්ගේ ලේඛන දක්නට නැත. එසේම රාවයද, මෙසේ කියයි.

''එල්.ටී.ටී.ඊ.ය අඩම්බර ලෙස සන්නද්ධ මාවතේම ඇලී සිටින්නේ, වෙනම රාජ්‍යයක් පිළිබඳව ඇති කරගෙන සිටින මනෝ රාජික සිහිනය නිසාය. සමස්ථ අරගලයම පූර්ණ වෙනසක් සිදුවනු ඇත්තේ ඒ සිහිනය අත්හැරිය දාටය. (2007. ජනවාරි 28 - රාවය) එම නිසා දැන් යුද්ධය කිරීම සාධාරණය.
කොන්දේසි විරහිත සාමය - අසීමිත බලය බෙදීම පිළිබඳ මතවාදී තලයේ මොවුන් දැරූ මතවල පලුදුවීම් හටගෙන ඇත. ජනතාව මොවුන්ගේ දෙබිඩි සාමයේ පණිවිඩය විශ්වාස කරන්නේ කෙසේද? විසම්මුතිය එයයි.

Dr. සුසන්ත ගුණතිලකගේ "The Civil Society" ග්‍රන්ථයේ කුමාර රූපසිංහ, ජයදේව උයන්ගොඩ, රොහාන් එදිරිසිංහ ආදීන්ගේ ඩොලර් සම්බන්ධ විස්තර කොට ඇත. මෙම පොතට එරෙහිව නීතිමය කටයුතු කරන බවට රූපසිංහ දැනටමත් තර්ජනය කොට ඇත. ඔහුගේ එක ලිපියක්, පල කර ගැනීම සඳහා රුපියල් තිස්දහසක මුදලක් මාස්පතා ජනප්‍රිය පුවත්පතකට ගෙවන බවට ''මව්බිම'' පුවත්පත කියා සිටියි. සාමය සඳහා වූ එක් ලිපියකට ''කාලෝ ෆොන්සේකා'' විසින් ලක්ෂ 13 ක පමණ මුදලක් ලබා ඇති බව ගුණතිලක සඳහන් කරයි. එසේම රාජ්‍ය නොවන සංවිධාන තේරීම් කාරක සභාව,''විජිත හේරත්'' මන්ත්‍රීවරයාගේ සභාපතිත්වයෙන් රැස් වූ විට ''නමවෙනි වසර පාසල් පොත්වලට බලය බෙදා හැරීම'' ගැන පාඩම්මාලා ඇතුළත් කල ජාතික අධ්‍යාපන ආයතන නිලධාරීන් තිදෙනෙක් ''සේව් ද චිල්ඩ්‍රන්'' නම් සංවිධානයෙන් මුදල් ලබාගත් බවත්, වරදක් සිදුවී ඇති බවත්, පිළිගත් බව ''සිළුමිණ'' පුවත්පත වාර්තා කොට තිබුණි.

එසේම ත්‍රස්ත විරෝධී ව්‍යාපාරය විසින් මෑතක අලවන ලද පෝස්ටරයක, ''සාම කොටි - වාම කොටි, මාධ්‍ය කොටි'' හඳුනා ගනිමු. විනාශ කරමු...'' යනුවෙන් විය. කැබිනට් අමාත්‍ය ''චම්පික රණවක කීවේ, මේ ජාතී ද්‍රෝහීන් නීතියෙන් මර්ධනය කරන්නට බැරි නම්, මොනන කෙහෙල්මලකින් හෝ එසේ කළ යුතු බවය.'' කොමියුනිස්ට් පක්ෂයේ ඩියු ගුණසේකර, සම සමාජ පක්ෂයේ තිස්ස විතාරණ ද තම සහෝදර අමාත්‍යවරයා ගැන නිශ්ශබ්දවව සිටින්නේ කෙසේද?

''උඩුවේ ධම්මාලෝක'' හෙළ උරුමයෙන් පාර්ලිමේන්තුවට ආවේ රනිල් රටකඩන ගිවිසුමට එරෙහිවය. නමුත් ඔහු නැවතුනේ ෆෙඩරල් දෙන රනිල්ගේ ජනාධිපතිවරණ වේදිකාවේය. තිලක් කරුණාරත්න සිංහලයා බේරා ගැනීමට හෙළ උරුමය පිහිටෙව්වේය. එය අතහැර දමා ඔහු ෆෙඩරල්වාදී රනිල්ගේ තුරුල්ලට ගියේ රට රැක ගැනීමට නොව පාර්ලිමේන්තුවට රිංගා ගැනීමටය.

මේ සූත්තරකාරයින් ගෙන් මිදී සාමය ලංකාවේ සැබෑ ජනතාවගෙන් මතුවිය යුතුය. සාමයේ විසංවාදය එයයි.

**නොවැළැක්විය හැකි හේතු මත**
**වි ක ධර්මබන්දු මහතා ලියන අපේ ගී හා සීපද**
**හා ආචාර්ය පාලිත ගණේවත්ත ලියන**
**මිතුරාගේ දිනපොත යන ලිපි**
**මෙවර පළ නොවන බව කරුණාවෙන් සළකන්න**